සැ. යු. - 2012.06.08 දින පළ වූ අංක 1762 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,763 - 2012 ජුනි 15 වැනි සිකුරාදා - 2012.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1022 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1025 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම

මදුරාවල ප්‍රාදේශීය සභාව

මදුරාවල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ 111 පංතිය කම්කරු | 03 | PL-1-2006A<br>රු. 11,730-10x120-10x130 - .<br>10x145 - 12 x 160 - රු. 17,600. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 02 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ 11 පංතිය මුරකරු | 02 | PL-1-2006A 12 පියවර<br>රු. 11,730-10x120-10x130 - .<br>10x145 - 12 x 160 - රු. 17,600. | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එක්වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් වී තිබීම; හෝ කාර්යාල සේවක සේවයේ වසර 06ක සක්‍රීය සේවා කාලයක් සහිතව 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වීම |
| 03 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආයුර්වේද ඖෂධ සංයෝජක | 02 | PL-1-2006A<br>රු. 11,730-10x120-10x130 -<br>10x145 - 12 x 160 - රු. 17,600 | 1. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම ;<br>*නැතහොත්*<br>ජාතික අ.පො.ස. පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම ;<br>*සහ*<br>2. රජයේ ආයුර්වේද බෙහෙත්ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත්ශාලවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පලපුරුද්දක් ලබාතිබීම. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය ;

(ii) අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය ;

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.) ;

(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය. ;

*03. බඳවා ගැනීමේ ක්‍රමය:*

සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

*04. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුවේ.
(iii) බඳවා ගනු ලබන සේවකයනී තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.
(iv) මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් හා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝග වලට ද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.
(v) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මදුරාවල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

*05. අයදුම්කල යුතු ආකාරය :-*

1. මෙම නිවේදනයේ සඳහන් ආකෘතිය පරිදි සකසන ලද අයදුම්පත් 2012.07.06 වැනි දිනට පෙර "ලේකම්, මදුරාවල ප්‍රාදේශීය සභාව, මදුරාවල, අඟුරුවාතොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.
2. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම්කරන තනතුරෙහි නම සඳහන් කල යුතුය.
3. දැනටත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික පිටපත් එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය ;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* පදිංචිය සනාථ කිරීමේ සහතික (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුවේ.) ;
*(ඈ)* වෙනත් සුදුසුකම් හෝ සේවා පලපුරුද්ද පිළිබඳ සහතික.

සඳසීලී කාරියවසම්,
ලේකම්,
මදුරාවල ප්‍රාදේශීය සභාව.
මදුරාවල.

2012 ක් වූ මැයි මස 30 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මදුරාවල ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල .......................................... තනතුර සඳහා බඳවා ගැනීම*

1. *(අ)* මුලකුරු සමග නම :——————————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. (අ) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? —————
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද :——————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
7. විවාහක/අවිවාහක බව :——————————.
8. දුරකථන අංකය :——————————.
9. උපන් දිනය : අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————.
10. 2012.07.06 වැනි දිනට වයස : අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර):——————————.
12. වෘත්තීය සුදුසුකම් ඃ——————————.
13. සේවා පළපුරුද්ද ඃ ——————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? ——————————.
15. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර ඃ ——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පුවුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ........................................................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැක./ නොහැක. ඔහු /ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

....................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම ඃ ...................................................................................
පදවි නාමය ඃ ...................................................................
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව යොදන්න)
දිනය ඃ ..................................................

**06-641**

---

## නිවැරදි කිරීමයි

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මීරිගම ප්‍රාදේශීය සභාව

2012.06.01 දින අංක 1761 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස තනතුරු ඇබෑර්තු යටතේ ඉහත මාතෘකාවෙන් පළවූ දැන්වීම් අංක 06-161 දරන දැන්වීමේ තනතුරු නාමය - සෞඛ්‍ය කම්කරු (කාර්යාල සේවක සේවයේ III ) සංඛ්‍යාව 01 යන්න 04 ලෙසත්, කාර්යාල කාර්ය සහායක (කාර්යාල සේවක සේවයේ II) සංඛ්‍යාව 04 යන්න 01 ලෙසත් නිවැරදි විය යුතුය.

ආර්. පී. සිරිමාන්න,
ලේකම්,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2012 ජුනි මස 05 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභාව.

06-710

# පළාත් පාලන නිවේදන

## අතුරලිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අතුරලිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ජී. නිහාල් ද සිල්වා,
සභාපති,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2012 අප්‍රේල් මස 30 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *මාර්ගයේ නම* | *ආරම්භක ස්ථානය* | *මාර්ගයේ අවසානය* | *ආරම්භයේ සිට අවසානය දක්වා ඉඩම් අයිතිකරුගේ නම* — *වම* | *දකුණ* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|---|---|---|
| යොවුන් මාවතේ ලන්දගහ වත්ත දක්වා දිවෙන මාර්ගය | හේවාකිරිය බෝක්කුව | ඌරුමුත්ත වත්ත | ආර්.කේ. විජේතුංග මයා<br>එච්. පී. සෝමසේන මයා<br>එච්. පී. සේන සන්ධ්‍යා මයා<br>එච්. පී. රුවන් චාමර මයා<br>ප්‍රසන්න සම්පත් මයා<br>එච්. පී. ජයවර්ධන මයා<br>එච්. පී. ගුණසේන මයා | ආර්. කේ. විජේතුංග මයා<br>එච්. පී. සෝමසේන මයා<br>එච්. පී. උදය කුමාර මයා<br>ප්‍රසන්න සම්පත් මයා<br>එච්. පී. ජයවර්ධන මයා<br>ඩී. ජී. ගුණපාල මයා | 300 m | 3 m |
| කෙහෙල්වල මාර්ගයේ බලක්කුව ආරම්භයේ සිට මුත්තෙට්ටුව දක්වා ඇති කෘෂි මාර්ගය | බලක්කුව පාලම | මුත්තෙට්ටුව | එච්. පී. ගුණවර්ධන මයා<br>වී. ජී. නිමලහාමි මිය | එළමල්දෙණිය රජ මහා විහාරය සතු කුඹුර<br>ඩබ්. එම්. පී. දාවිත් මයා | 400 m | 16' හා 10' |
| බෝපගොඩ වලන්දෙනිය දිවිතුර මාර්ගය | මලංදෙනිය හන්දිය | දිවිතුර නාවල මාර්ගය | එල්. එච්. එම්. ප්‍රියන්ත මයා<br>ඥානවතී මිය<br>බේකරිය ඉඩම<br>දෙනියාය ගෙදර චාලට් මිය<br>පී. පී. අමරදාස මයා<br>පියසේන මයා<br>පියසේන මයා | සමරසිංහ මයා<br>ශාන්ති මිය<br>ජීවන්ත මයා<br>සොමිලතා මිය<br>කරුණාදාස මයා<br>ප්‍රියන්ත මයා<br>දර්ශනී මිය<br>චමින්ද ලාල් මයා<br>ප්‍රේමවතී මිය<br>පියදාස මයා | 800 m | 16' |
| ඌරුමුත්ත පහල-වෙල මැදවත්ත සිට පල්ලෙකන්ද දක්වා මාර්ගය | මැදවත්ත හන්දිය | පල්ලෙකන්ද පොතුකැටිය අමුණ | | රක්ෂිත ඇළ | 700 m | 11' |

| මාර්ගයේ නම | ආරම්භක ස්ථානය | මාර්ගයේ අවසානය | ආරම්භයේ සිට අවසානය දක්වා ඉඩම් අයිතිකරුගේ නම<br>වම | <br>දකුණ | මාර්ගයේ දිග | මාර්ගයේ පළල |
|---|---|---|---|---|---|---|
| හීනිපැල්ලගොඩ මාර්ගයේ සිට කොඩිහේන හරහා අඹගහ වත්ත දක්වා දිවෙන මාර්ගය | හීනිපැල්ලගොඩ | අඹගහහේන | උෟරුමුත්ත වත්ත<br>පී. සෝමදාස මයා<br>එච්. ජී. චන්ද්‍රා මිය | උෟරුමුත්ත වත්ත<br>පී. සෝමදාස මයා<br>එච්. පී. පත්මසිරි මයා<br>පී. මානෙල් නිශාන්ත මයා<br>පි. ඒ. ගුණරත්න මයා<br>පී, පී. චන්ද්‍රපාල මයා<br>පී. පී. රංජිත් තුෂාර මයා<br>එස්. ඒ. ජයවතී මිය | 350 m | 12' |
| දෙල්ගහවිල නා ගහවත්ත පාර | නා ගහ ලග | විල්පිට කඩපල | පොල්පැල දුව වත්ත<br>පොල්පැල දුව<br>කුඹුර නිල කොවුල<br>කුඹුර<br>මානගෙවත්ත<br>ප්‍රේමලාල් මහතාගේ ඉඩම<br>තිලක් මහතාගේ ඉඩම<br>පරණවිතාන මහතාගේ ඉඩම, දෙල්ගහවිල තිලක් මහතාගේ ඉඩම | අලුත් ගෙදර ඉඩම<br>මානගෙවත්ත<br>ධම්මික මහතාගේ ඉඩම<br>මානගෙවත්ත<br>මානගෙවත්ත ඉඩම් කොටසක් | 232 m | 10' |
| රසීනා ගවුස්වත්ත පාර | | | එම්. ඒ. එම්. සරුෂ මයා<br>එම්. එම්. එම්. ඇල්ෂ මයා<br>එම්. මහවුෂන් මයා<br>ඒ. ඒ. එම්. අස්ලාම් මයා<br>එන්. ආර්. එෆ්. රිස්නා මිය<br>ගොඩපිටිය ගෙවත්ත<br>එච්. ටී. ෆාතිමා මිය<br>එම්. ආර්. එෆ් ෆරීනා මිය<br>ගොඩපිටිය ගොඩ<br>එම්. ආර්. ෆාතිමා සපීඩා මිය | මුෆාරිෆ මයා<br>එම්. බී. එම්. සිද්දික් මයා<br>අන්සාර් හජ්ජියාර් මයා | 150 m | 6' |
| පල්ලෙගොඩ පාර | පල්ලෙගොඩ හන්දිය | පල්ලෙගොඩ ඉඩම | ජයදේව මයා<br>ලෙස්ලි කුමාර මයා<br>ජයවර්ධන මයා<br>අබේගුණසේකර මයා<br>තල්ගහගොඩ හින්නි මහතා<br>පියසේන මයා | ගුණතිලක මයා<br>මාටින් මයා<br>ඩී. ඒ. දාර්ලිස් මයා<br>අබේගුණසේකර මයා<br>තල්ගහගොඩ හින්නි මහතා<br>එන්. ජී. ඇඩ්වින් මයා<br>එන්. ජී. හරමානිස් මයා | 270 m | 12' |
| කනත්ත වත්ත හන්දිය | කනත්ත වත්ත හන්දිය | ගොන්ගස්ගොල්ල ඉඩම | ඇළ<br>සුමතිපාල මයා<br>බී. ජී, කෙනඩි මයා<br>උදේනිස් මයා<br>ආර්. ඩී. දයාවතී මිය | පිනේරිස් මයා<br>ප්‍රේමදාස මයා<br>පියදාස මයා<br>කෙනඩි මයා<br>බී. පී. බෙනට් මයා<br>උදේනිස් මයා<br>ආර්. ඩී. දයාවතී මිය<br>ගොන්ගස්ගොල්ල ඉඩම | 800 m | 12' |

06-456

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පාරවල් ඔස්සේ ගොඩනැගිලි සීමා ලකුණු කිරීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වැනි වගන්තිය (අ) උපවගන්තිය මගින් සැලසී ඇති ප්‍රතිපාදන පරිදි සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සහ එම අධිකාරිය යටතේ පාලනය වන්නාවූ ද වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සහ එම දෙපාර්තමේන්තු පාලනයට යටත්වන්නාවූ ද සියළුම මාර්ගවල මධ්‍ය ලක්ෂයේ සිට අඩි 50ක් වූ මෙහි මින් මතු"ගොඩනැගිලි සීමාව" වශයෙන් සඳහන් කරනු ලබන සීමාවන් ඇතුළත යම් ගොඩනැගිල්ලක්, මායිම් වැටක්, තාප්පයක් හෝ ගේට්ටුවක් ඉදිකිරීම නිත්‍යානුකූල නොවන බවටත් ආ පනතේ 21 වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉහත ආයතනයන්ට අයත් මාර්ග හැර අන් සියළුම මාර්ග සම්බන්ධ පොදු අධිකාරිය ප්‍රාදේශීය සභාව වන බැවින් එම සියලුම මාර්ගවල මධ්‍ය ලක්ෂයේ සිට අඩි 25ක් ගොඩනැගිලි සීමාව ලෙස ද, සභා බල ප්‍රදේශය තුළ කට්ටි කරන ලද ඉඩම්වල පිහිටි අභ්‍යන්තර මාර්ග සම්බන්ධයෙන් වන විට මෙම සීමාව අඩි 20ක් ලෙස සැලකීම සුදුසු බවට ද එම සීමාව තුළ සභාව විසින් දෙන ලද බලයක් යටතේ හැර කිසිදු ඉදිකිරීමක් සිදු කිරීම නිත්‍යානුකූල නොවන බව පිළිගත යුතු යයි ද 2011 දෙසැම්බර් මස 27 වැනි දින පැවති මහා සභාවට යෝජනා කර, එම සභාව විසින් පිළිගෙන ඇති හෙයින් මෙම නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරන ලද දැන්වීමක් මගින් ප්‍රකාශයට පත්කරලීමෙන් පසුව එම *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට වලංගු එකක් සේ ක්‍රියාත්මක විය යුතු බවටද මෙයින් යෝජනා කරමි.

ආනන්ද ජයලත්,
සභාපති,
වාරියපොල ප්‍රාදේශීය සභාව.

2011 දෙසැම්බර් මස 30 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභාවේ දී ය.

06-464/1

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**


ප්‍රාදේශීය සභාව වෙත සතු කරන ලද මංමාවත් පිළිබඳ දැන්වීම


1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21, 22 සහ 23 වගන්ති මගින් සැලසී ඇති ප්‍රතිපාදන පරිදි සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට සහ වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සහ එම ආයතනය මගින් පාලනය වන්නාවූ මාර්ග හැර අන් සියළුම මාර්ග වාරියපොල ප්‍රාදේශීය සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.


උක්ත පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ග වාරියපොල ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණුකර අනුරේඛනය කර ඇති මෙම මාර්ග අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශව විසින් යම් විරුද්ධත්වයක් පළකර සිටින්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දිනයේ සිට තෙමසක් ඇතුළත මාර්ගයේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙසත් 2011 දෙසැම්බර් මස 27 වැනි දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 4 යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.


ආනන්ද ජයලත්,
සභාපති,
වාරියපොල ප්‍රාදේශීය සභාව.


2011 දෙසැම්බර් මස 30 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා වේ දී ය.























































































































































































06-464/2

## මොරටුව මහ නගර සභාව

ගෝඝාතක ආඥා පනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානවල මස් වෙළඳාම සඳහා මස් කඩයක් පවත්වාගෙන යාම පිණිස 2012 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත් (272 වැනි අධිකාරිය) ආඥා පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එන්. එස්. අංගම්මන,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2012 මාර්තු මස 27 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

**උපලේඛනය**

| | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමෙහි ස්වභාවය* |
|---|---|---|---|
| (1) | මොහොමඩ් රෂාක් මොහොමඩ් මිස්වර් අංක 22, කරුණාරත්න පාර හේනමුල්ල, පානදුර | උස්වත්ත නගර සභා ගවමස් කඩය | ගවමස් |
| (2) | මොහොමඩ් ශිහාර් අකීල් ෆාකීර් අහමඩ් අංක 12/2, උස්වත්ත, I පටුමග මොරටුව | දිගරොල්ල නගර සභා ගවමස් කඩය | ගවමස් |
| (3) | අමීර් අම්සාර් මොහොමඩ් රිෂාඩ් අංක 66/32, සාවියා පාර, හේනමුල්ල, පානදුර. | කටුබැද්ද නගර සභා ගවමස් කඩය | ගවමස් |
| (4) | අබ්දුල් අසීස් හයාතුල් බාවා අංක 179/2/A, ගාලු පාර රත්මලාන | උයන නගර සභා ගවමස් කඩය | ගවමස් |
| (5) | ජවුපර් සාදික් මොහොමඩ් අලි අංක 333, II අදියර, බඩෝවිට ගල්කිස්ස. | දිගරොල්ල නගර සභා කුකුල් මස් කඩය | කුකුල්මස් |
| (6) | කමල් බච්චා මොහොමඩ් ෆාසුල් අංක 26/5, ගාලුපාර, මොරටුව | මධ්‍යම වෙළඳ පොල නගර සභා ගව මස් කඩය | ගවමස් |
| (7) | කමල් බච්චා මොහොමඩ් ෆාසුල් අංක 26/5, ගාලුපාර, මොරටුව | මධ්‍යම වෙළඳ පොල නගර සභා එළු මස් කඩය | එළුමස් |
| (8) | කමල් බච්චා මොහොමඩ් ෆාසුල් 26/5, ගාලුපාර, මොරටුව | කොරළවැල්ල නගර සභා ගව මස් කඩය | ගවමස් |

06-490

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.